## චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ

# ටූනා මත්ස්‍යය බිම් පුරෝකතන සේවාව

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන
නියෝජිතායතනය




# බහුදින යාත්‍රා සඳහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථනය

## නිකුත්කල දිනය : 2022-05-09

| දේශාංශ | | | අක්ෂාංශ | | | පන්න ගැඹුර |
|---|---|---|---|---|---|---|
| අංශක | මිනිත්තු | | අංශක | මිනිත්තු | | බඹ |
| 88 | 38 | E | 11 | 38 | N | 42 |
| 59 | 29 | E | 9 | 1 | N | 55 |
| 60 | 59 | E | 8 | 24 | N | 58 |
| 79 | 33 | E | 6 | 13 | N | 34 |
| 78 | 4 | E | 5 | 14 | N | 31 |
| 78 | 39 | E | 4 | 58 | N | 35 |
| 78 | 42 | E | 3 | 56 | N | 38 |
| 89 | 20 | E | -7 | 41 | S | 25 |
| 80 | 10 | E | -5 | 48 | S | 25 |
| 77 | 52 | E | -4 | 39 | S | 29 |
| 79 | 12 | E | -3 | 21 | S | 41 |
| 77 | 52 | E | -2 | 9 | S | 40 |

0112 520193 / 0112 520367

WhatsApp 070 272 3990

Service credits: "Generated using E.U. Copernicus Marine Service Information. GMI data are produced by Remote Sensing Systems and sponsored by NASA Earth Science funding

**බහු දින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය**
**උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශය සඳහා**

**(2022 මැයි මස 09 දින පෙ.ව. 07.00 ට, ඉදිරි පැය 24 සඳහා නිකුත් කරන ලදි.)**

**දිවයින වටා වන මුහුදු ප්‍රදේශ**

**වැසි තත්ත්වය:**

කන්කසන්තුරය සිට මන්නාරම, පුත්තලම, කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර හෝ නිරිත දෙසින් හමා එයි. සුළගේ වේගය පැ.කි.මී. (20-40) පමණ වේ. කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වා සහ මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී.(50-60)** පමණ දක්වා වැඩි විය හැක. සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. 50** පමණ දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වා සහ මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළුවේ. සෙසු මුහුදු ප්‍රදේශ තරමක් රළු විය හැක.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

**බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය**

**ගිණිකොන දිග බෙංගාල බොක්ක ආශ්‍රිතව පැවති "අසනි" සුළි කුණාටුව, චණ්ඩ සුළි කුණාටුවක් බවට වර්ධනය වී ඇති අතර මැයි 08 වන දින 2330 පැය වනවිට උතුරු අක්ෂාංශ 13.0 (N) සහ නැගෙනහිර දේශාංශ 87.5 (E) ආසන්නයේ, ත්‍රිකුණාමලයේ සිට කි.මී. 840 ක් පමණ ඊසාන දෙසින් කේන්ද්‍රගත වී පැවතිණි. එය මැයි 10 වන දින දක්වා වයඹ දෙසට ගමන් කර බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක ප්‍රදේශය වෙත පැමිණීමටත් ඉන්පසුව උතුරට බරව ඊසාන දෙසට හැරී වයඹ දිග බෙංගාල බොක්ක ප්‍රදේශය වෙත ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.**

**ධීවර සහ නාවික ප්‍රජාව මේ සම්බන්ධයෙන් විමසිලිමත් වන ලෙසත් ඉදිරි කාලගුණ අනාවැකි පිළිබඳව අවධානයෙන් පසු වන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.**

**කාලගුණික තත්ත්වය:**

| | |
|---|---|
| 00-20N, 83E-100E | : බොහෝ ස්ථාන වල වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |

**සුළං තත්ත්වය:**

| | |
|---|---|
| 10N-20N, 83E-95E | : වාමාවර්තව භ්‍රමණය වේ / පැ.කි.මී. (40-60), විටින් විට පැ.කි.මී. (70-90) දක්වා. |
| 00-06N, 80E-90E | : බස්නාහිර හෝ නිරිත දෙසින් / පැ.කි.මී. (40-50), විටින් විට පැ.කි.මී. (60-70) දක්වා. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : නිරිත සිට දකුණ දක්වා දිශාවලින් / පැ.කි.මී.(20-40), විටින් විට පැ.කි.මී. 50 දක්වා. |

**මුහුදේ ස්වභාවය:**

| | |
|---|---|
| 10N-20N, 83E-95E | : ඉතා රළු, විටින් විට දළ රළු. |
| 00-06N, 80E-90E | : රළු, විටින් විට ඉතා රළු. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : මඳ වශයෙන් රළු, විටින් විට තරමක් රළු. |

**<u>අරාබි මුහුද</u> :**

**කාලගුණික තත්ත්වය**

| | |
|---|---|
| 00-05N, 60E-80E | : බොහෝ ස්ථාන වල වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| 05N-10N, 75E-80E | : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| 05N-10N, 60E-75E | : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : ප්‍රධාන වශයෙන් වැසි රහිත. |

**සුළං තත්ත්වය:**

| | |
|---|---|
| 00-06N, 65E-80E | : බස්නාහිර දෙසින් / පැ.කි.මී. (20-40), විටින් විට පැ.කි.මී. (50-60) දක්වා. |
| 06N-20N, 70E-80E | : වයඹ දෙසින් / පැ.කි.මී. (20-40), විටින් විට පැ.කි.මී. 50 දක්වා. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : වයඹ සිට බස්නාහිර දක්වා දිශාවලින් / පැ.කි.මී.(20-35). |

**මුහුදේ ස්වභාවය:**

| | |
|---|---|
| 00-06N, 65E-80E | : තරමක් රළු, විටින් විට රළු දක්වා. |
| 06N-20N, 70E-80E | : මඳ වශයෙන් රළු, විටින් විට තරමක් රළු. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : මඳ  වශයෙන් රළු. |

**<u>දකුණු ඉන්දියානු සාගරය</u>**

**කාලගුණික තත්ත්වය:**

| | |
|---|---|
| 00-10S, 70E-100E | : බොහෝ ස්ථාන වල වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |

**සුළං තත්ත්වය:**

| | |
|---|---|
| 00-10S, 80E-100E | : දක්ෂිණාවර්තව භ්‍රමණය වේ / පැ.කි.මී. (30-40), විටින් විට පැ.කි.මී. (50-70) දක්වා. |
| 00-05S, 60E-80E | : නිරිත දෙසින් / පැ.කි.මී. (20-40), විටින් විට පැ.කි.මී. (50-60) දක්වා |
| සෙසු මුහුදු ප්‍රදේශ | : ගිනිකොණ දෙසින් / පැ.කි.මී. (20-40), විටින් විට පැ.කි.මී. 50 දක්වා. |

**මුහුදේ ස්වභාවය:**

| | |
|---|---|
| 00-10S, 80E-100E | : තරමක් රළු සිට රළු දක්වා, විටින් විට ඉතා රළු. |
| 00-05S, 60E-80E | : තරමක් රළු, විටින් විට රළු. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : මඳ වශයෙන් රළු, විටින් විට තරමක් රළු. |

****ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

AMRodrigo

කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.